# තෝරා ගත් ප්‍රශ්න: ඉස්ලාමය පිළිබඳ නිතර අසන ප්‍රශ්න ඇතුළත් ශබ්ද කෝෂයෙන් .

(ඊමාන් හෙවත් විශ්වාසය හා බැඳුණු කොටස)

වැදගත් කරුණු (1)

## ප්‍ර 1- අල්ලාහ් යනු කවු ද?

ඉස්ලාමය තුළ අල්ලාහ් (දෙවියන්) යනු සවර් ලෝකයන්හි හා සියලුම මැවීම්හි පරමාධිපතිය. ඔහුගේ ආශිවර්ාදය තුළින් ඔහු ඒවා මවා පෝෂණය කර පරිපාලනය කරයි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:﴾ٱلۡحَمۡدُ لِلَّهِ رَبِّ ٱلۡعَٰلَمِينَ﴿ "සියලු ප්‍රශංසා සවර් ලෝකයන්හි පරමාධිපති වන අල්ලාහ්ටම හිමිය."(අල්-ෆාතිහා: 2)

ඔහු සියලු මැවීම්හි මැවුම්කරු, රජුය, පෝෂක හැ එකම සැලසුම්කරුය, සියළු මැවීම්හු හී එකම පාලකයාය, ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:﴾ رَّبُّ ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضِ وَمَا بَيۡنَهُمَا فَٱعۡبُدۡهُ وَٱصۡطَبِرۡ لِعِبَٰدَتِهِۦۚ هَلۡ تَعۡلَمُ لَهُۥ سَمِيّٗا﴿ "(ඔහු) අහස් හා මහපොළොවේ ද ඒ දෙක අතර ඇති දෑහි ද හිමිපාණන්ය. එහෙයින් නුඹ ඔහුට නැමදුම් කරනු. තවද ඔහුට නැමදුම් කිරීම සඳහා නුඹ ඉවසනු. ඔහුට (සමානව) නම් කළ හැකි කෙනෙකු නුඹ දන්නෙහි ද?"(සූරා මයර්ම්: 65)

සැබෑ ලෙස නැමදුම් ලබන්නා ඔහු පමණය. ඔහු හැර සැබෑ ලෙස නැමදුම් ලබන වෙනත් කිසිවකු නැත. එය දේවත්වයේ ගුණාංග මෙන්ම මැවීම, නියෝගය, තීන්දුව, නීතිගත කිරීම යනාදී ඔහුට පමණක් සතු වූ පරිපූණර් ගුණාංග තුළින් ඔහු විස්තර කර ඇති බැවිනි. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත.﴾وَلَهُ ٱلۡمَثَلُ ٱلۡأَعۡلَىٰ فِي ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضِۚ﴿ "...තවද අහස්හි හා මහපොළොවෙහි උසස් උපමාවන් ඔහු සතු ය..."(රූම්: 27)

සියලු ප්‍රශංසා හා පරිපූණර් ගුණාංග සතු ඔහු පරිපූණර්ය, තේජාන්විතය, සවර්බලධාරීය. ඔහුට අලංකාර නාම හා උසස් ගුණාංග ඇත. උත්තරීතරයාණන් මෙසේ පවසයි.﴾وَلِلَّهِ ٱلۡأَسۡمَآءُ ٱلۡحُسۡنَىٰ فَٱدۡعُوهُ بِهَاۖ﴿ "වඩාත් අලංකාර නාමයන් අල්ලාහ්ට හිමිය. එහෙයින් නුඹලා ඒවා තුළින් ඔහු අමතනු..."(අල්-අඃරාෆ්: 180)

ශ්‍රවණයෙහි පරිපූණර් වූ ඔහු සවර් ශ්‍රාවකය. බැල්මෙහි පරිපූණර් වූ ඔහු සවර් නිරීක්ෂකය. දැනුමෙහි පරිපූණර් වූ ඔහු සවර්ඥානීය. සියලු දැහි බලවත් වූ ඔහු සවර්බලධාරීය. සුවිශුද්ධ වූ ඔහු ව කිසිවකු විසින් පරාජය කළ නොහැක.සෑම මැවීමක් හා සෑම ජීවයක් මත තම කරුණාව ව්‍යාප්ත වී ඇති ඔහු මහා කාරුණිකය පරම දයාබරය. දේවත්වය විශ්වාස කරන මුඃමින්වරුන්ට අතිශය කරුණාවන්තය.ඔහු අමරණීයය, ප්‍රාරම්භකය ඔහුට පෙර කිසිවක් නැත; අවසානය ද ඔහුය; ඔහුට පසුව වෙනත් කිසිවක් නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴾ هُوَ ٱلۡأَوَّلُ وَٱلۡأٓخِرُ وَٱلظَّٰهِرُ وَٱلۡبَاطِنُۖ وَهُوَ بِكُلِّ شَيۡءٍ عَلِيمٌ﴿ "ඔහු ප්‍රාරම්භකය; අවසානය; බාහිරය; අභ්‍යන්තරය. තවද ඔහු සියලු දෑ පිළිබඳ සවර් ඥානීය."(අල්-හදීද්: 3)

තම මැවීම් පිළිබඳ යථාථර්යන් මැනවින් දන්නා, ඒවා ප්‍රගුණ කර, ඒවා සම්පූණර් කළ මහා ප්‍රඥාවන්තයා ඔහුය. තම මැවීමෙහිද, අණදීමෙහිද ප්‍රඥාව ඇත්තේ ඔහු සතුව ය.

ඔහුට කිසිදු සමානයක් හෝ සහකාරියක් හෝ දරුවකු හෝ පියකු හෝ නැත. සුවිශුද්ධයාණන්ට කිසිවක් සමාන වන්නේ ද නැත. උත්තරීතරයාණන් මෙසේ පවසයි:﴾1" قُلۡ هُوَ ٱللَّهُ أَحَدٌ *ٱللَّهُ ٱلصَّمَدُ *لَمۡ يَلِدۡ وَلَمۡ يُولَدۡ *وَلَمۡ يَكُن لَّهُۥ كُفُوًا أَحَدُۢ﴿. (නබිවරය!) නුඹ පවසනු. ඔහු එනම් අල්ලාහ් ඒකීයය. 2. අල්ලාහ් ස්වාධීනය. 3. ඔහු ජනිත නොකළේය. තවද ජනිත කරනු නොලැබුවේය. 4. තවද ඔහුට සමාන කිසිවෙකු නැත."(අල්-ඉක්ලාස්: 1-4)උත්තරීතර අල්ලාහ් මෙසේ ද පවසා ඇත.﴾ لَيۡسَ كَمِثۡلِهِۦ شَيۡءٞۖ وَهُوَ ٱلسَّمِيعُ ٱلۡبَصِيرُ﴿ "ඔහුට සමාන කිසිවක් නැත. තවද ඔහු සවර් ශ්‍රාවකය, සවර් නිරීක්ෂකය."(අෂ්-ෂූරා: 1)

සියලු මැවීම්වලට ඉහළින් ඇති "අෂර්" හෙවත් දිව්‍ය රාජ්‍යයට ඉහළින් ඔහු ස්ථාපිත විය. උත්තරීතරයාණන් මෙසේ පවසයි:﴾الرَّحْمَنُ عَلَى الْعَرْشِ اسْتَوَى﴿ "මහා කරුණාන්විතයාණන් අෂර් මත ස්ථාපිත විය."(සූරා තාහා: 5)

තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි:﴾وَهُوَ ٱلۡقَاهِرُ فَوۡقَ عِبَادِهِۦۚ وَهُوَ ٱلۡحَكِيمُ ٱلۡخَبِيرُ﴿ "තම ගැත්තන්ට ඉහළින් සිටින සවර්බලධාරී ඔහුය. තවද ඔහු ප්‍රඥාවන්තය (සියලු තොරතුරු) මැනවින් දන්නාය."(සූරා අල්-අන්ආම්: 18)

වැදගත් කරුණු (1)

## ප්‍ර 2- අල්ලාහ්ගේ පැවැත්ම පෙන්වා දෙන සාධක මොනාවාද?

පි 2 - උත්තරීතර අල්ලාහ්ගේ පැවැත්ම පෙන්වා දෙන සාධක වනුයේ නිවැරැදි බුද්ධිය, සහජ ධමර්තාව සහ ඍජු මාගර් වේ. මිනිස් බුද්ධිය තමන්ට නියම කරන දෑට පිටින් සිටින අයකු හැර වෙනත් කිසිවෙක් එය ප්‍රතික්ෂේප කරන්නේ නැත.මක්නිසාද යත්, මෙම ජීවින්ට ඒවා නිමර්ාණය කළ මැවුම්කරුවෙකු සිටිය යුතු අතර එය අවශ්‍ය වේ. මන්ද මෙම

මැවීම් මැවුම්කරුවකු හෝ උත්පාදකයකු හෝ නොමැති ව පවතිනු ඇතැයි පැවසීම, එය නිෂ්ඵල ප්‍රකාශයක් යන්න බුද්ධිය ප්‍රකාශ කර සිටියි. එබැවින් නිමර්ාණකරුවෙකු නොමැතිව කිසිවක් පැවතිය නොහැක!මෙම මැවීම් තමන් විසින්ම නිමර්ාණ වූවක් බව පැවසීම විකාර සහගත හා විය නොහැකි කරුණකි. හේතුව යම් දෙයක් ශුන්‍යතාවයෙන් සිදු නොවන බැවිනි.සැබැවින්ම මෙම මැවීම් මැවූ යම් මැවුම්කරුවකු සිටින්නේ නම්, ඔහු ප්‍රඥාවන්ත නිමර්ාණශීලී සවර්ඥානී සවර්බලධාරී අල්ලාහ්ය.ඉතා පැහැදිලි ව හා වඩාත් සංශිප්ත ව මෙම වෙනස අල්ලාහ් පෙන්වා දී ඇත. ඔහු මෙසේ පැවසීය:{أَمْ خُلِقُوا مِنْ غَيْرِ شَيْءٍ أَمْ هُمُ الْخَالِقُونَ "කිසිවක් නොමැති ව ඔවුන් මවනු ලැබුවෝ ද? එසේ නැතහොත් මවන්නෝ ඔවුහු ද?"أَمْ خَلَقُوا السَّمَاوَاتِ وَالْأَرْضَ بَل لَّا يُوقِنُونَ} "ඔවුහු අහස් හා මහපොළොව මැව්වෝද? එසේ නොව ඔවුහු ස්ථිර ලෙස විශ්වාස නොකරති."(අත්-තූර්: 35, 36)මේ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ඇතැමෙකු මෙසේ ප්‍රශ්න කරන ලදී.ඔබේ පරමාධිපතිව හඳුනා ගන්නේ කවර කරුණක් තුළින් ද? ගොම, ඔටුවා පෙන්වා දෙන අතර පා සළකුණු මාගර්ය පෙන්වා දෙයි. මණ්ඩාකිනි සහිත අහසක්, පැළීම් සහිත භූමියක් රළ සහිත මුහුදක්; මේවා ප්‍රඥාවන්ත මහා කාරුණිකයාණන් පෙන්වා නො දෙන්නේ ද?!

සැබැවින්ම මෙම මැවීම් කළමනාකරණය කරන සැළසුම් කරුවකු සිටිය යුතු අතර එය අවශ්‍ය වූවකි. ඔබ ඉහළ සහ පහළ ලෝකය දෙස බැලුවහොත්, ඔබ එහි පරිපූණර් විධිවිධානයක් දකිනු ඇත. සෑම දෙයක්ම එයට සුදුසු ස්වරූපයක් ලබා ඇති අතර, සියලු මැවීම් ඒවා විධිමත් කරන හා ඒවායෙහි පැවැත්ම සහතික කරන දැට මඟ පෙන්වනු ලබති.මෙම ස්ථාවරත්වය සියලු මැවීම් තුළ ගණන් කළ නොහැකි ආකාරවලින් සහ ස්වරූපවලින් පුනරාවතර්නය වී ඇත. එය අහම්බෙන් සහ අහඹු බව පිළිබඳ න්‍යාය සමඟ විය නොහැක!ඒ ගැන උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා පෙන්වා දී ඇත:{ صُنْعَ اللَّهِ الَّذِي أَتْقَنَ كُلَّ شَيْءٍ} "...එය සෑම දෙයකටම ස්ථාවරත්වයක් ඇති කළ අල්ලාහ්ගේ නිමැයුමකි..."(අන්-නම්ල්: 88)

තවදුරටත් මෙසේ ප්‍රකාශ කරයි:{قَالَ رَبُّنَا الَّذِي أَعْطَى كُلَّ شَيْءٍ خَلْقَهُ ثُمَّ هَدَى} "සෑම දෙයකටම එහි ස්වරූපය පිරිනමා පසුව මග පෙන්වූ අපගේ පරමාධිපතියාණන් මෙසේ පවසයි…"(තාහා: 50)අදේවවාදීන් පිරිසක් අබූ හනීෆා (රහිමහුල්ලාහ්) තුමා හමු වී, මැවුම්කරුගේ පැවැත්ම පෙන්වා දෙන සාධක මොනවා ද? යැයි විමසා සිටියෝය. එවිට හෙතෙම ඔවුනට: "මට ඉඩ දෙන්න, මගේ මනස අමුතු කාරණයකින් කායර්බහුල වී ඇත." යැයි පැවසීය. එවිට ඔවුන්: එය කුමක්ද? යැයි විමසා සිටි විට, හෙතෙම: "ටයිග්‍රීස් (නදියෙ)හි ආශ්වයර්මත් භාණ්ඩවලින් පිරුණු විශාල නැවක් ඇති බවත්, එය කිසිවකු ක්‍රියාත්මක නොකරම ආපසු එන යන බවත්, එය මෙහෙයවන්නට කපිතාන්වරයෙකු නැති බවත් මට දැන ගන්නට ලැබුණි." යැයි පැවසීය.

එවිට ඔවුහු ඔහුට: ඔබට විකාරද? ඔහු: මොකක්? යැයි ඇසිය. ඔවුහු: "සිහිබුද්ධියෙන් යුත් පුද්ගලයෙකු විසින් මෙය විශ්වාස කරනු ඇත්ද?" යැයි විමසුහ. ඔහු ඔවුනට: "මේ ලෝකය පවතින බව ඔබේ බුද්ධිය සහතික කළේ කෙසේ ද? සැබැවින්ම විවිධ වගර්, විවිධ ජාති සහ ආශ්වයර්මත් සිදුවීම් සහිත මෙම විශ්වය, ගමන් කරමින් භ්‍රමණය වන මෙම ගෝලය, යනාදියෙහි සිදුවීම් නිමර්ාණය කළ අයකුගෙන් තොර ව සිදු වන්නේ ද? මෙම සිදුවීම් ක්‍රියාත්මක කරන කිසිවකු නොමැතිව ක්‍රියාත්මක වන්නේ ද? යැයි විමසා සිටියේය. පසුව ඔවුහු ඔවුනට දොස් නගමින් හැරී ගියහ.

ශුද්ධ වූ පරමාධිපතියාණන්ගේ පැවැත්ම පෙන්වා දෙන සාධක ගණන් කළ නොහැකි තරමට අධිකය. ඒවායින් සමහරක් මෙසේය:සහජ ධමර්තාවසහජ ධමර්තාව යනු පුද්ගලයෙකු තමා තුළම ලබන සහ එය වළක්වා ගත නොහැකි සහජ දෙයකි.ඒ අතරින් සෑම මැවීමක්ම ශුද්ධ වූ උත්තරීතර මැවුම්වරුවෙවෙ සිටින බව පෙන්වා දීම ද එකකි.එමෙන්ම රැකවරණය, ස්ථාවරත්වය, නතු කර දී තිබීම යනාදී සාධක හා ගණන් නොහැකි මෙන්ම සීමා කළ නොහැකි වෙනත් දෑ ද ඒ අතරින් වෙති. ඒ සෑම කරුණක්ම, ප්‍රඥාවන්ත, සියල්ල සැලසුම් කරන, සවර්බලධාරී මැවුම්කරුවකු සිටින බව පෙන්වා දෙයි.

වැදගත් කරුණ (1)

# ප්‍ර 3- අල්ලාහ්ගේ ඒකීයත්වයය පිළිගැනීමේ දී අනිවායර්ය වන සාධක මොනවා ද?

ඔහුගේ පරිපාලනය සම්බන්ධයෙන් ඔහුගේ ඒකීයත්වය පිළිගැනීමේ අනිවායර්ය වන සාධකය වනුයේ සැබැවින්ම මැවුම්කරු, පාලක හා සැළසුම් කරන්නා ඔහු පමණක් වීම ය. ඔහුට කිසිදු හවුල් කරුවකු නැත.

ඒ අතරට උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය ද ඇතුළත් වේ.﴿ مَا اتَّخَذَ اللَّهُ مِنْ وَلَدٍ وَمَا كَانَ مَعَهُ مِنْ إِلَٰهٍ إِذًا لَذَهَبَ كُلُّ إِلَٰهٍ بِمَا خَلَقَ وَلَعَلَا بَعْضُهُمْ عَلَىٰ بَعْضٍ سُبْحَانَ اللَّهِ عَمَّا يَصِفُونَ ﴾ "අල්ලාහ් කිසිදු දරුවකු නොගත්තේය. තවද ඔහු සමග කිසිදු දෙවියකු ද නොවීය. එසේ වූයේ නම්, සෑම දෙවියෙකුම ඔහු මැවූ දෑ සමග යන්නට බලනු ඇත. ඔවුන්ගෙන් ඇතැමෙකු ඇතැමෙකුට වඩා උසස් වන්නට බලනු ඇත. ඔවුන් වර් ණනා කරන දැයින් අල්ලාහ් සුවිශුද්ධය."(අල්-මුඃමිනූන්: 9)

විද්වතුන් "දලීලුත් තමානු" යනුවෙන් නම් කර ඇති සාධකය මෙම පාඨය ඇතුළත් කර ඇත. ඉන් අදහස් කරන්නේ අල්ලාහ් සමග වෙනත් දෙවියකු අපි නියම කර ගත්තේ නම්,එක්කෝ ඔහුගේ දේවත්වය පිළිගැනීමෙන් හෝ එය ඔහු සතුව ඇතැයි වාද කිරීමෙන් හෝ විය හැක.පළමු නියමය එහි දේවත්වය නිෂ්ප්‍රභා කරයි. මන්ද යටහත් වන්නා දේවත්වය නියම කර ගත් දෙයක් වන අතර ඔහු දෙවියෙකු නොවන බැවිනි. එසේත් නැතිනම් ඔහුගේ ආධිපත්‍යය සහ අධිකාරිය ගැන වාද කිරීම වනාහි, සෑම දෙවි කෙනෙකුම තම මැවිල්ලට අනන්‍ය වන පරිදි තමන් විසින් මවන ලද දේ සමඟ ගමන් කරමින් එය කුරිරු ලෙස පාලනය කරමින් විශ්වයේ අනෙකුත් දෙවිවරුන් අබිබවා යෑමේ ගැටුම්කාරී තත්ත්වයක් ඉස්මතු

වෙයි.එක් එක් අයගේ රාජ්‍යය අනෙක් අයගේ රාජ්‍යයට වඩා වෙනස් බවත්, ඔවුන්ගෙන් සමහරෙක් එකිනෙකාට වඩා බලවත් බවත් ඔබ දකිනු ඇත. ඔබ ලෝකයේ රජවරුන්ගේ රජකම්වල වෙනස්කම් සහ ඔවුන් අභිබවා යන රාජ්‍යයන්ගේ තත්වය දකින පරිදි, මොවුහු ද එසේ අභිබවා යනු ඇත. රාජ්‍යයන් අතර වෙනස්කම් සහ දෙවිවරුන් අභිබවා යාම පිළිබඳ කිසිදු හෝඩුවාවක් ඔබ නොදකින විට සැබැවින්ම ඔහු එකම දෙවියා බවත් සියලු දෑ ඔහුගේ අධිපත්‍යය යටතේ පවතින බවත් ඔබ දැනගත යුතුය.

යමෙක්: දෙවිවරුන් අතර යම් ආකාරයක එකඟතාවයක් ඇත, එබැවින් සෑම දෙවි කෙනෙකුම භේදයකින් හෝ ගැටුමකින් තොරව තමන් නිමර්ාණය කළ දෑ සමග ඔවුන් වෙන්ව ඇතැයි පවසන්නේ නම්, එහි ද ඔවුන්ගේ දේවත්වය වලංගු නොවන බවට ඉමහත් සාක්ෂියක් දක්නට ලැබේ. මන්ද සෑම දෙවියෙකුටම ඔහු නිමර්ාණය නොකළ කණ්ඩායම සම්බන්ධයෙන් අසම්පූණර් දේවත්වයක් එමගින් පෙන්වා දෙන බැවිනි.මෙය, එක් එක් දෙවිවරුන් තුළ අසම්පූණර්ත්වයට තුඩු දෙන අතර, එය කළ නොහැකි බව නියම කරයි. මන්ද සැබෑ දේවත්වයට අවශ්‍ය කරනුයේ පරිපූණර්ත්වය මිස අසම්පූණර්කම නොවේ.

අල්ලාහ්ගේ දේවත්වය තුළ ඔහු ඒකීයත්වයට පත් කිරීමේ අනිවාර්යය සාධක වනාහි: සලාතය, ප්‍රාථර්නාව, නිහතමානීකම පැවරුම යටහත්භාවය, බිය හා අපේක්ෂාව, කැපවීම හා භාරය, උදව් පැතීම හා ආරක්ෂාව පැතීම, උපකාර ඉල්ලීම යනාදී කිසිදු හවුල් කිරීමකින් තොරව අල්ලාහ්ට පමණක් කරන නැමදුම් වගර් අතරින් බාහිර හා අභ්‍යන්තර සියලුම නැමදුම් වගර් සවර්බලධාරී අල්ලාහ්ට පමණක් වෙන් කර, නැමදුම ඔහුට පමණක් නියම කර ගැනීමය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿يَـٰٓأَيُّهَا ٱلنَّاسُ ٱعْبُدُوا۟ رَبَّكُمُ ٱلَّذِى خَلَقَكُمْ وَٱلَّذِينَ مِن قَبْلِكُمْ لَعَلَّكُمْ تَتَّقُونَ﴾ "අහෝ ජනයිනි! නුඹලා හා නුඹලාට පෙර සිටි අය මැව්වා වූ නුඹලාගේ පරමාධිපතිට නමදිනු. නුඹලා බිය බැතිමත් විය හැකි වනු පිණිස."(අල්-බකරා: 21)

ඒ අනුව, පරමාධිපති වන ඔහුය නැමදුමට සුදුසුකම් ලබන්නා. ඔහු හැර පාලනයට ලක්වන සෙසු මැවීම් ඒ සඳහා සුදුසුකම් නොලබනු ඇත.

බහුදේව වාදීන් විසින් අල්ලාහ් හැර වෙනත් දෙවිවරුන් පත් කර ගැනීම බොහෝ බුද්ධිමය සාධක තුළින් අල්ලාහ් ව්‍යාථර් කළේය. ඒවා අතරින්:ඔවුන් තෝරා පත්කර ගත් කිසිදු දෙවියකු තුළ දේවත්වයේ ලක්ෂණ දක්නට නැත. ඒවාද මවනු ලැබූ දෑ වන අතර ඒවා කිසිවක් මවන්නේ නැත. ඒවා තම ගැත්තන් හට සෙත සළසන්නේ නැත. ඔවුනට අත්වන හානිය වළක්වන්නේ ද නැත. ඔවුනට ජීවත් කරවීමේ හෝ මරණයට පත් කිරීමේ කිසිදු බලයක් නැත. අහස්හි හා මහපොළොවෙහි කිසිවක් ඔවුනට අයිති නැත.

ඒ ගැන උත්තරීතරයාණන්ගේ ප්‍රකාශය මෙසේය.﴿وَٱتَّخَذُوا۟ مِن دُونِهِۦٓ ءَالِهَةً لَّا يَخْلُقُونَ شَيْـًٔا وَهُمْ يُخْلَقُونَ وَلَا يَمْلِكُونَ لِأَنفُسِهِمْ ضَرًّا وَلَا نَفْعًا وَلَا يَمْلِكُونَ مَوْتًا وَلَا حَيَوٰةً وَلَا نُشُورًا﴾ "තවද ඔවුහු ඔහු හැර දමා වෙනත් දෙවිවරුන් ගත්තෝය. ඔවුන් කිසිවක් නොමවනු ඇත. ඔවුහු පවා මවනු ලැබූවන් වෙති. තවද ඔවුනට යම් හානියක් හෝ සෙතක් හෝ සැලසීමට ඔවුන් බලය නොදරනු ඇත. තවද (කිසිවක්) ජීවත් කරවීමට හෝ මරණයට පත් කිරීමට හෝ නැවත නැගිටුවීමට හෝ ඔවුන් බලය නොදරනු ඇත."(අල්-ෆුර් කාන්: 3)

අල්ලාහ්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය:﴿قُلِ ٱدْعُوا۟ ٱلَّذِينَ زَعَمْتُم مِّن دُونِ ٱللَّهِ لَا يَمْلِكُونَ مِثْقَالَ ذَرَّةٍ فِى ٱلسَّمَـٰوَٰتِ وَلَا فِى ٱلْأَرْضِ وَمَا لَهُمْ فِيهِمَا مِن شِرْكٍ وَمَا لَهُۥ مِنْهُم مِّن ظَهِيرٍ﴾ "අල්ලාහ් හැර දමා නුඹලා විශ්වාස කළවුට නුඹලා ඇරයුම් කරනු. අහස්හි හා මහපොළොවේ අණුවක තරම් ප්‍රමාණයක් හෝ ඔවුන් සතුව නැත. තවද ඒ දෙකෙහි කිසිදු හවුලක් ද ඔවුනට නොමැත. ඔවුන් අතරින් කිසිදු උරදෙන්නකු හෝ ඔහුට නැතැයි (නබිවරය!) නුඹ පවසනු."(සබඃ: 22)

අල්ලාහ්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය:﴿أَيُشْرِكُونَ مَا لَا يَخْلُقُ شَيْـًٔا وَهُمْ يُخْلَقُونَ﴾ "ඔවුන් ද ඔහු විසින් මවනු ලැබ සිටිය දී, කිසිවක් නොමවන දෙයකට ඔවුහු ආදේශ තබන්නෝද?(අල්-අඃරාෆ්: 191)

මැවීම් අල්ලාහ් විසින් මවා තිබිය දී, ඒවාට කිසිවක් මවන්නට හැකියාවක් නැති තත්තවයේ, මෙම බහුදේවවාදීහු අල්ලාහ්ට නැමදුම් කිරීමෙහි ඒවා ආදේශ කර ගන්නෝනෝ?

දෙවිවරුන්ගේ තත්ත්වය මෙසේ වූ විටෙක, ඒවා දෙවිවරුන් ලෙස ගැනීම මෝඩකම වන අතර එය නිෂ්ඵල අථර් ශූන්‍යය වේ.

අල්ලාහ්ගේ නාම හා ගුණාංග තුළ ඔහු ඒකීයත්වයට පත් කිරීමේ අනිවාර්යය සාධක වනාහි: සැබැවින්ම මැවුම්කරු අනෙකුත් මැවීම් මෙන් නොවන බව අප වටහා ගැනීමය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පැවසීය:﴿لَيْسَ كَمِثْلِهِۦ شَىْءٌ ۖ وَهُوَ ٱلسَّمِيعُ ٱلْبَصِيرُ﴾ "ඔහුට සමාන කිසිවක් නැත. තවද ඔහු සවර් ශ්‍රාවකය, සවර් නිරීක්ෂකය."(අෂ්-ෂූරා: 11)

﴿لَيْسَ كَمِثْلِهِۦ شَىْءٌ﴾ "ඔහුට සමාන කිසිවක් නැත."එනම්: ඔහු තම පැවැත්ම, නාම, ගුණාංග හො ක්‍රියා යනාදී කිසිවක ඔහුගේ කිසිදු මැවීමකට සමාන වන්නේ නැත. මන්ද යත් ඔහුගේ සියලුම නාම අලංකාරය, ඔහුගේ ගුණාංග අති උසස් හා පරිපූණර්ය. උත්තරීතරයාණන්ගේ ක්‍රියාවන් කිසිදු හවුල්කරුවකු නොමැතිව අතිමහත් මැවීම් උත්පාදනය කළේය. ඔහු සියලුම ආකාරයේ පූණර්ත්වය පිදුම් ලත් බැවින් ඔහු මෙන් කිසිවකු නැත.

ෂරියා මගින් දක්වා ඇති නම් සහ ගුණාංග තහවුරු කිරීම සඳහා තාර් කික සාක්ෂියක් වන්නේ මෙසේ පැවසනු ලැබීමය:

1- මෙම ශ්‍රේෂ්ඨ ජීවීන්, ඔවුන්ගේ විවිධත්වය, ඔවුන්ගේ වෙනස්කම්, ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමේ විධිමත්භාවය සහ ඔවුන් වෙනුවෙන් සකස් කරන ලද සැලසුම්වල ප්‍රගතිය මත පිහිටා තිබීම අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය, ඔහුගේ බලය, ඔහුගේ දැනුම, ඔහුගේ ප්‍රඥාව, ඔහුගේ කැමැත්ත සහ ඔහුගේ අභිමතය පෙන්නුම් කරයි.

2- ආශිර්වාදය සහ උපකාරය, හානිය දුරු කිරීම සහ දුක් වේදනා සමනය කිරීම; මේ දේවල්වලින් පෙන්නුම් කරන්නේ දයාව, ත්‍යාගශීලී බව සහ උපකාරශීලී බව ය.

3- අකීකරුවූවන් හට දඬුවම් පමුණුවීම, ඔවුන්ට සම ප්‍රතිචාර දැක්වීම යන කරුණු දෙකින් පෙන්නුම් කරන්නේ ඔවුන් මත වන අල්ලාහ්ගේ කෝපය හා ඔහුගේ පිළිකුලයි.

4- කීකරුවූවන් හට ගෞරව කිරීම සහ තිළිණ පිරිනැමීම යන කරුණු දෙකින් පෙන්නුම් කරන්නේ ඔවුන් ගැන වන අල්ලාහ්ගේ ප්‍රසාදය හා ප්‍රේමය යි.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත:﴿وَلَهُ ٱلۡمَثَلُ ٱلۡأَعۡلَىٰ فِي ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضِۚ وَهُوَ ٱلۡعَزِيزُ ٱلۡحَكِيمُ﴾ "...තවද අහස්හි හා මහපොළොවෙහි උසස් උපමාවන් ඔහු සතුව ඇත. තවද ඔහු සවර් බලධාරීය; මහා ප්‍රඥාවන්තය."(අර්-රූම්: 27) එනම්: කවර කරුණක් පිළිබඳ ගුණ ගායනා කරනු ලැබ ඇත්තේ ද ඒවායෙහි ඉහළම පරමාදශර්යන් සුවිශුද්ධයාණන් සතුය. ඔහු මෙන් කිසිවක් නැත. එම ඉහළම පරමාදශර්යන් තුළ දෙදෙනෙකුට හවුල් විය නොහැක. එසේ දෙදෙනකු එකිනෙකා සම වූයේ නම් එකෙක් අනෙකාට වඩා උසස් විය නොහැක්කේමය. එසේ එකිනෙකාට සම නොවූයේ නම්, ඉහළ පරමාදශර්වලින් වණර්නා කරනු ලබනුයේ ඔවුන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණි. එහෙයින් උසස් පරමාදශර්යෙකු සතු අයෙකුට කිසිදු සමානයෙකු හෝ ආදේශකයෙකු හෝ සිටිය නොහැකිය.

වැදගත් කරුණ (1)

# ප්‍ර 4- අල්ලාහ් අප මැව්වේ ඇයි? අප බිහි කිරීමේ අරමුණ කුමක් ද?

අප මැවීමේ ප්‍රඥාව හා අප බිහි කිරීමේ අරමුණ මහා ප්‍රඥාවන්ත සවර්ඥ සවර් බලධාරී අල්ලාහ් තම පුස්තකයේ අපට මෙසේ දන්වා සිටියි.﴿وَمَا خَلَقۡتُ ٱلۡجِنَّ وَٱلۡإِنسَ إِلَّا لِيَعۡبُدُونِ﴾ "තවද ජින් වගර්යා හා මානව වගර්යා වන ඔවුන් මට ගැතිකම් කිරීමට මිස මම නොමැව්වෙමි."(අද්-දාරියාත්: 56)

මෙය ජින් වගර්යා හා මානව වගර්යා මවනු ලැබූ හා ඒ වෙත ඇරයුම් කිරීම සඳහා සියලුම දූතවරුන් එවනු ලැබූ අරමුණයි. එනම් අල්ලාහ්ට නැමදුම් කිරීම ය. එහි ඔහුව හඳුනා ගැනීම, ඔහුට ආදරය කිරීම, ඔහු වෙත යොමු වීම, ඔහු මත භාර කිරීම හා ඔහු හැර සෙසු දෑ ප්‍රතික්ෂේප කිරීම යනාදිය ඇතුළත් වෙයි.

මෙම අරමුණින් කවරෙකු බැහැර වූයේ ද අල්ලාහ්ගේ දඬුවමට ඔහු සුදුසුකම් ලබනු ඇත. කවරෙකු එය පිළිපැද්දේ ද ඔහු සදා සැප පහසුකම් විඳින්නට සුදුසුකම් ලබනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:﴿مَنۡ عَمِلَ صَٰلِحٗا مِّن ذَكَرٍ أَوۡ أُنثَىٰ وَهُوَ مُؤۡمِنٞ فَلَنُحۡيِيَنَّهُۥ حَيَوٰةٗ طَيِّبَةٗۖ وَلَنَجۡزِيَنَّهُمۡ أَجۡرَهُم بِأَحۡسَنِ مَا كَانُواْ يَعۡمَلُونَ﴾ "යම් පිරිමියකුගෙන් හෝ වේවා කාන්තාවකගෙන් හෝ වේවා දේවත්වය විශ්වාස කරන්නෙකු ලෙස සිට යමෙකු දැහැමි කටයුත්තක් කළේ ද එවිට යහපත් ජීවිතයක් අපි ඔහුට උදා කරන්නෙමු. තවද ඔවුන් සිදු කරමින් සිටි දැට ඉතා යහපත් අයුරින් ඔවුන්ගේ ප්‍රතිඵල අපි ඔවුනට පිරිනමන්නෙමු."(අන්-නහ්ල්: 97)

වැදගත් කරුණු (1)

# ප්‍ර5- උත්තරීතර අල්ලාහ්ව මැව්වේ කවු ද?

පි5: මූලික වශයෙන්ම මෙම ප්‍රශ්ණය නිෂ්ඵලය. තකර්යක් ලෙස උත්තරීතර අල්ලාහ්ට මැවුම්කරුවකු සිටින බව අප නියම කර ගත්තේ නම්, ප්‍රශ්න කරන්නා "මැවුම්කරු මැවූ මැවුම්කරු කවු ද? පසුව මැවුම්කරු මැවූ මැවුම්කරුගේ මැවුම්කරු කවු ද? යන්නෙන් විමසා සිටිනු ඇත. එසේ නිමක් නැතිව ප්‍රශ්නය දීඝර්වී යයි.

මෙය මනසින් කළ නොහැකි දෙයකි.

සියලු දෑ මැවූ මැවුම්කරු සමග සියලුම මැවීම් අවසන් වී යයි. ඔහුව කිසිවෙකු මැව්වේ නැත. ඔහු හැර සෙසු සියල්ල ඔහු මැව්වේය. මෙය තර් කයට හා බුද්ධියට අනුකූලය. ඔහු ශුද්ධ වූ සැබෑ දෙවියාය.

ඒ සඳහා වන සාධකය නම් උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශයයි:﴿هُوَ ٱلۡأَوَّلُ وَٱلۡأٓخِرُ وَٱلظَّٰهِرُ وَٱلۡبَاطِنُۖ وَهُوَ بِكُلِّ شَيۡءٍ عَلِيمٌ﴾ "ඔහු ප්‍රාරම්භකය; අවසානය; බාහිරය; අභ්‍යන්තරය. තවද ඔහු සියලු දෑ පිළිබඳ සවර් ඥානීය."(අල්-හදීද්: 3)

මෙම පාඨය සඳහා වන විග්‍රහය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් මෙසේ වාතර්ා කරන ලදී."අහෝ දෙවියනි! ඔබයි ආරම්භක, ඔබට පෙර කිසිවක් නැත. ඔබයි අවසානය, ඔබට පසු කිසිවක් නැත."මෙය මුස්ලිම් විසින් වාතර්ා කර ඇත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය."අල්ලාහ් විය. ඔහු හැර වෙනත් කිසිවක් නොවීය."තවත් වාතර්ාවක"ඔහුට පෙර කිසිවක් නොවීය."මෙම වාර් තා දෙකම බුහාරි තුමා විසින් දන්වා ඇත.

මෙම ප්‍රශ්නයට පළමු ප්‍රතිකාරය මෙයයි.

දෙවැනි ප්‍රතිකාරය වනුයේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් වාතර්ා කළ හදීස් අනුවය:"මෙය අල්ලාහ් මැවූ මැවීමය. අල්ලාහ්ව මැව්වේ කවුදැයි පවසන තරමට මිනිස්සු ප්‍රශ්න කරමින්ම සිටිති. කවරෙකුට මෙවැන්නක් හට ගැනුනේ ද ඔහු "ආමන්තු බිල්ලාහ්" මම අල්ලාහ්ව විශ්වාස කරමි යැයි පැවසිය යුතුය."

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:ඔබ අතරින් කෙනෙකු වෙත ෂෙයිතාන් පැමිණ අහස මැව්වේ කවුද? භූමිය මැව්වේ කවුද? යැයි විමසයි. එවිට ඔහු අල්ලාහ් යැයි පවසනු ඇත. පසුව ඒ අයුරින්ම පවසා සිටී. ඊට අමතරව "ඔහුගේ දූතයා" යැයි ද සඳහන් වී ඇත.

අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පැවසූහ:"ඔබ අතරින් කෙනෙකු වෙත ෂෙයිතාන් පැමිණ මේ මේ දේවල් මැව්වේ කවුදැ?යි විමසයි. අවසානයේ ඔබේ පරමාධිපති ව මැව්වේ කවුදැ?යි ඔහුගෙන් විමසා සිටියි. එවැන්නක් වෙත ළඟා වූ විට ඔහු අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතා ඉන් වැළකී සිටිය යුතු ය."

මේ සියල්ල වාතර්ා කර ඇත්තේ ඉමාම් මුස්ලිම් විසිනි.

මෙම හදීස්වල:

මෙම ප්‍රශ්ණයේ මූලාරම්භය පැහැදිලි කර ඇත. ඔහු ෂෙයිතාන්ය. ඒ සඳහා වන ප්‍රතිකාරය හා ප්‍රතිචාරය ද පැහැදිලි කර ඇත. එනම්:

1- අනතුරු දායක දැයින් නොමඟ යෑමෙන් හා ෂෙයිතාන්ගේ මුළා කිරීමෙන් වැළකී සිටීම.

2- "ආමන්තු බිල්ලාහි වරසූලිහි" (මම අල්ලාහ් හා ඔහුගේ දූතවරුන් විශ්වාස කරමි) යැයි පැවසීම.

3- ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව අල්ලාහ් වෙත පැතීම.

තුන් වරක් වම් පැත්තට කෙළ ගසා, "කුල් හුවල්ලාහු අහද්" නම් සූරාව  කියවීම ගැන ද  වාතර්ා වී ඇත.

පිළිතුර අවසානයේ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:﴿ذَٰلِكُمُ ٱللَّهُ رَبُّكُمۡۖ لَآ إِلَٰهَ إِلَّا هُوَۖ خَٰلِقُ كُلِّ شَيۡءٖ فَٱعۡبُدُوهُۚ وَهُوَ عَلَىٰ كُلِّ شَيۡءٖ وَكِيلٞ﴾ "ඔහුය නුඹලාගේ පරමාධිපති වන අල්ලාහ්. ඔහු හැර නැමදුම් ලබන්නට කිසිවකු නොමැත. සියලු දෑහි මැවුම්කරුය. එබැවින් නුඹලා ඔහුට වන්දනාමාන කරනු. තවද සියලු දෑහි භාරකරු වන්නේද ඔහුය."(අල්-අන්ආම්: 102)

වැදගත් කරුණු (1)

# ප්‍ර6- නපුර මවනු ලැබ ඇත්තේ ඇයි?

පි6 : අල්ලාහ් නපුර නිමර්ාණය කළේ ඇයි යන ප්‍රශ්නය ඇසීම හෝ එයට විරුද්ධ වීම හෝ නොකළ යුතුය. මක්නිසාදයත් මැවුම්කරු සවර් බලධාරී අල්ලාහ් වන අතර ඔහු කරන දේ ගැන ඔහුගෙන් විමසනු නොලැබේ. ඒ වෙනුවට ප්‍රශ්න අසනුයේ ඔහු ය. උත්තරීතරයාණන් මෙසේ පවසයි:﴿لَا يُسۡـَٔلُ عَمَّا يَفۡعَلُ وَهُمۡ يُسۡـَٔلُونَ﴾ "(අල්ලාහ් වන) ඔහු කරන දෑ පිළිබඳ ව ඔහු විමසනු නොලබයි. නමුත් විමසනු ලබනුයේ ඔවුහුමය."(අල්-අන්බියා: 23)යහපත හා අයහපතෙහි පැවැත්ම පිළිබඳ ඇතැම් ප්‍රඥාන්විත කරුණු පහත සඳහන් පරිදිය.

- වගකීම් පැවරුනු පුද්ගලයා යහපත හා අයහපත තුළින් පරීක්ෂාවට සහ විභාගයට ලක් කිරීම. එමගින් සෙසු අයගෙන් ඉවසිලිවන්තයා කවු දැයි යන්නත් තවත් අයගෙන් දේවත්වය විශ්වාස කළ මුඃමින්වරයා කවුදැයි යන්නත් පැහැදිලි වනු ඇත.﴿ٱلَّذِي خَلَقَ ٱلۡمَوۡتَ وَٱلۡحَيَوٰةَ لِيَبۡلُوَكُمۡ أَيُّكُمۡ أَحۡسَنُ عَمَلٗاۚ وَهُوَ ٱلۡعَزِيزُ ٱلۡغَفُورُ﴾ "ඔහු වනාහි මරණය සහ ජීවය මැව්වේ ය. (මන්ද) නුඹලා අතරින් කවරෙකු ක්‍රියාවෙන් වඩාත් දැහැමි දැයි ඔහු නුඹලා ව පරීක්ෂා කරනු පිණිසය. තවද ඔහු සවර් බලධාරීය; අතික්ෂමාශීලීය."(අල්-මුල්ක්: 2)

සුවිශුද්ධයාණන් මෙසේ පවසයි:﴿وَنَبۡلُوكُم بِٱلشَّرِّ وَٱلۡخَيۡرِ فِتۡنَةٗۖ وَإِلَيۡنَا تُرۡجَعُونَ﴾ "...තවද පරීක්ෂණයක් ලෙස අපි නපුරෙන් හා යහපතින් නුඹලා පිරික්සන්නෙමු. තවද නුඹලා නැවත යොමු කරනු ලබනුයේ අප වෙතමය."(අල්-අන්බියා: 35)

අල්ලාහ් තම ගැත්තන් මෙලොවෙහි බිහි කර, ඇතැම් දෑ ඔවුනට නියෝග කළේය. තවත් දෑ ඔවුනට තහනම් කළේය. යහපත හා අයහපත, ධනවත්කම හා දුප්පත්කම, ගෞරවය හා නින්දාව, ජීවය හා මරණය යනාදියෙන් ඔහු ඔවුන් පරීක්ෂාවට ලක් කළේය. එය ඔවුන් අතරින්  කවරෙකු යහ ක්‍රියා සිදු කරන්නේ දැයි පරීක්ෂා කරනු පිණිසය. එය පරීක්ෂාවට ලක්වන තැන්වල පරීක්ෂාවට පත් වන්නේ කවුද? ඉන් ආරක්ෂා වන්නේ කවුදැ?යි සෝදිසි කරනු පිණිසය.﴿وَإِلَيۡنَا تُرۡجَعُونَ﴾ "නුඹලා නැවත යොමු කරනු ලබනුයේ අප වෙතමය."එහෙයින් අපි නුඹලාට නුඹලාගේ ක්‍රියාවන් සඳහා ප්‍රතිඵල පිරිනමන්නෙමු. එය යහපත් නම් යහපතකි එය නපුරු නම් නපුරකි.﴿وَمَا رَبُّكَ بِظَلَّٰمٖ لِّلۡعَبِيدِ﴾. "ඔබේ පරමාධිපති ගැත්තන්හට අපරාධ කරන්නෙකු නොවේ."

- විශ්වයේ ද්විත්ව භාවය තහවුරු කිරීම; යහපත දැනගත හැකිවනුයේ නපුර දැන ගැනීමෙන් පමණි. ඒවාට ප්‍රතිවිරුද්ධ දෑ වෙන්කර හඳුනාගත හැකි අතර, යහපතෙහි පැවැත්ම සඳහා නපුර අවශ්‍ය වන්නේ එය එයට එරෙහිව ක්‍රියා කරන බැවිනි. හොඳ නරක සහ ඒවා තුළ ඇති අස්ථාවරත්වය මෙලොව ජීවිතයේ ස්වභාවයේ කොටසකි.

නපුර සාපේක්ෂ ය; ඇතැමෙකුට අයහපත් ලෙස පෙනෙන කාරණයක් අනෙක් අයට හොඳ ලෙස පෙනෙනු ඇත. උදාහරණයක් ලෙස සොරෙකුගේ අත කපා දැමීම ඔහුට නපුරකි. නමුත් එහි සමාජයට යහපත ඇත. හේතුව එය එකිනෙකාගේ මුදල් සම්බන්ධයෙන් ඉක්මවා කටයුතු කිරීමෙන් මිනිසුන් වළක්වන බැවිනි.

වගකිව යුතු තැනැත්තාට සාධාරණය ඉටු කරන්නා පරීක්ෂාවට ලක් කිරීමේ සැබෑ අර් ථය සාක්ෂාත් කර ගැනීම; සවර්බලධාරී අල්ලාහ් මිනිසාට යහපත සහ අයහපත යන මාර් ගය පෙන්වා දුන් අතර, ඒවායින් එකක් තෝරා ගැනීමේ නිදහස ඔහුට පිරිනමා ඇත.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත.﴿أَلَمۡ نَجۡعَل لَّهُۥ عَيۡنَيۡنِ "අපි ඔහුට දෑස් ඇති නොකළෙමු ද?"وَلِسَانٗا وَشَفَتَيۡنِ "දිව ද දෙතොල් ද (ඇති නොකළෙමු ද?)"وَهَدَيۡنَٰهُ ٱلنَّجۡدَيۡنِ﴾ "තවද අපි ඔහුට (හොඳ නරක යන) මාවත් දෙක වෙත මඟ පෙන්වූයෙමු."(අල්-බලද්: 8-10)එනම්: බැලීම සඳහා දෑස් හා කතා කිරීම සඳහා දිව හා දොතොල් අපි ඔහු වෙනුවෙන් නිර් මාණය නොකළෙමු ද? යහපත හා අයහපත යන මාර් ගය ඔහු වෙනුවෙන් අපි පැහැදිලි නොකළෙමු ද?

- ඇත්තෙන්ම අප දකින බොහෝ අයහපත් දෑ, සෑම අංශයකින්ම ශුද්ධ අයහපතක් නොවනු ඇත. නමුත් ඇතැම් විට ඒවා තුළ හොඳ පැත්තක් ද තිබිය හැක. නරක ලෙස දකින දේවල් තුළ යහපත් දෑ කොපමණක් තිබේ ද? ඇතැම් විට මිනිසා රෝගාතුර වෙයි. එය ඔහුට සිදුවන්නට තිබූ ඊට වඩා බරපතල නපුරකින් ඔහු වෙනතකට යොමු කරන සාධකයක් විය හැක. පුද්ගලයෙකුට මූල්‍යමය ගනුදෙනුවක් අහිමි වී යයි. නමුත් ඔහු ඇතැම් විට එය උපයා තිබුණේ නම්, ඔහු සීමාව ඉක්මවා බලහත්කාරයෙන් කටයුතු කරන්නට තිබුණි. මිනිසෙකුට දරුවෙක් අහිමි විය හැක. ඇතැම් විට ඔහු ජීවත් වූයේ නම් ඔහුට නපුරක් විය හැක.යම් පුද්ගලයෙක් තමාගේ ක්‍රියාව වෙනුවෙන් නිරය ලැබීමට සුදුසු විය හැකිය. එය සැබෑ ව්‍යසනය යි. නමුත් අල්ලාහ් ඔහුට විපතක් ඇති කරයි. ඔහු එය ඉවසා දරා ගනියි.  අවසානයේ ඔහුගේ ඉවසීම සඳහා ඔහුට ස්වර් ගය නියම කර ප්‍රතිඵල ලබා දෙයි. එයයි සැබෑ සහ ස්ථිර යහපත වන්නේ.

සවර්බලධාරී අල්ලාහ් ශුද්ධ නපුර නිමර්ාණය නොකරන අතර, සහීහ් හදීසයේ සඳහන් කර ඇති පරිදි නපුර ඔහුට ආරෝපණය නොකෙරේ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පවසා සිටියහ."නපුර ඔබෙන් හටගන්නේ නැත."මෙය මුස්ලිම් විසින් වාතර්ා කර ඇත.

- යහපත හා නපුර පැවැත්මේ ප්‍රඥාන්විත තවත් කරුණක් වනුයේ, සවර් බලධාරී අල්ලාහ්ට ප්‍රතිවිරුද්ධ දේ ඇති කිරීමට ඇති හැකියාව ඉස්මතු කිරීම සහ ඔහුගේ බලවත් නාමවල බලපෑම් මතු කිරීම ය. එනම්: සවර්බලධාරි අල්ලාහ් මධර්නය කරන්නා, සමප්‍රතිචාර දක්වන්නා, යුක්තිය ඉටු කරන්නා යනාදී ඔහුගේ නම් සහ ක්‍රියාවන්ගේ බලපෑම් පෙන්වීමය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි.﴿ٱللَّهُ ٱلَّذِى خَلَقَ سَبۡعَ سَمَٰوَٰتٍ وَمِنَ ٱلۡأَرۡضِ مِثۡلَهُنَّ يَتَنَزَّلُ ٱلۡأَمۡرُ بَيۡنَهُنَّ لِتَعۡلَمُوٓاْ أَنَّ ٱللَّهَ عَلَىٰ كُلِّ شَىۡءٖ قَدِيرٌ وَأَنَّ ٱللَّهَ قَدۡ أَحَاطَ بِكُلِّ شَىۡءٍ عِلۡمَۢا﴾ "අහස් හතක් හා මහපොළොවෙන් ද ඒවාට සමාන දෑ මැව්වේ අල්ලාහ්ය. නියත වශයෙන්ම අල්ලාහ් සියලු දෑ කෙරෙහි ශක්තිය ඇත්තා බවත් සියලු දෑ පිළිබඳ ව දැනුමෙන් ඔහු සර් ව ප්‍රකාරයෙන් වටලාගෙන සිටින බවත් නුඹලා දැන ගනු පිණිස ඒවා අතරට (ඔහුගේ) නියෝගය පහළ වනු ඇත."(අත්-තලාක්: 12)

නපුර ඒ වෙනුවෙන්ම අරමුණු කර ගත් එකක් නොවේ. එසේම මැවීම් නිමර්ාණය කරනු ලැබූ අරමුණ ද එය නොවේ. ඒවා ආදරණීය දෙයකට නියම කර එයට මාර් ගයක් සාදා ගත් ප්‍රතිවිපාක වේ. එයට නියම කළ දේ සිදු වුවහොත්, ඒවා අඩු වී නැති වී යන අතර කාරණය ශුද්ධ යහපතට නැවත පැමිණේ.මෙලොව තාවකාලික වාසස්ථානයක් බවත්, එය පරීක්ෂණ, අර් බුද සහිත අසම්පූර් ණ ස්ථානයක් බවත්, මෙලොව පරම පරිපූර් ණත්වය දැකීමට අපේක්ෂා කරන තැනැත්තා පරලොව පරිපූර් ණත්වයේ වාසස්ථානය බවට නියම කරන දිව්‍ය ප්‍රඥාවට විරුද්ධ බවත් තරයේ විශ්වාස කිරීමට පෙර නපුරේ පැවැත්ම ගැන ප්‍රඥාව කිසිවෙකුට වටහා ගත නොහැක.

දේවත්වය විශ්වාස කළ තැනැත්තා සම්බන්ධයෙන් උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි.﴿يَٰقَوۡمِ إِنَّمَا هَٰذِهِ ٱلۡحَيَوٰةُ ٱلدُّنۡيَا مَتَٰعٞ وَإِنَّ ٱلۡأٓخِرَةَ هِىَ دَارُ ٱلۡقَرَارِ﴾ "අහෝ මාගේ ජනයිනි! නියත වශයෙන්ම මේ මෙලොව ජීවිතය සුළු භුක්ති විඳීමක් පමණි. තවද නියත වශයෙන්ම මතු ලොව සදා නිවහනය."(ගාෆිර්: 39)

වැදගත් කරුණු (1)

# ප්‍ර7- විශ්වාසය සම්බන්ධයෙන් හා ඒකදේව වාදයේ කරුණුවලදී ඇති වන කුකුස් සඳහා ප්‍රතිකාරය කුමක් ද?

කුකුස් සඳහා වන ප්‍රතිකාර පහත සඳහන් කරුණු තුළින් සිදු වනු ඇත.

- දේවත්වය විශ්වාස කරන මුඃමින්වරයා දැනුම තුළින් තමන්ව ආරක්ෂා කර ගත යුතුය. අඥානකම මිනිසුන් හා ජින්නුන් අතර සිටින ෂෙයිතානුන්ගෙන් මිනිසුන් අතරට පිවිසෙන්නකි.

- අල්ලාහ්ව සිහිපත් කිරීම හා හෙළා දකිනු ලැබූ ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව පැතීම.

- නොනවතින සැකයන් අවසන් කර දමා ඒවා මුලිනුපුටා දැමීම.

- දැනුමැති විද්වතුන්ගෙන් විමසා සිටීම. උත්තරීතරයාණන් මෙසේ පවසයි:﴿فَسۡـَٔلُوٓاْ أَهۡلَ ٱلذِّكۡرِ إِن كُنتُمۡ لَا تَعۡلَمُونَ﴾ "...එහෙයින් නුඹලා නොදැන සිටියෙහු නම්, දැනුමැත්තන්ගෙන් විමසනු."(අන්-නහ්ල්: 43)

තෝරා ගත් ප්‍රශ්න: ඉස්ලාමය පිළිබඳ නිතර අසන ප්‍රශ්න ඇතුළත් ශබ්ද කෝෂයෙන් . ........................................ 1

- ප්‍ර 1- අල්ලාහ් යනු කවු ද? ........................................ 1
- ප්‍ර 2- අල්ලාහ්ගේ පැවැත්ම පෙන්වා දෙන සාධක මොනාවාද? ........................................ 1
- ප්‍ර 3- අල්ලාහ්ගේ ඒකීයත්වයය පිළිගැනීමේ දී අනිවායර්ය වන සාධක මොනවා ද? ........................................ 2
- ප්‍ර 4- අල්ලාහ් අප මැව්වේ ඇයි? අප බිහි කිරීමේ අරමුණ කුමක් ද? ........................................ 4
- ප්‍ර5- උත්තරීතර අල්ලාහ්ව මැව්වේ කවු ද? ........................................ 4
- ප්‍ර6- නපුර මවනු ලැබ ඇත්තේ ඇයි? ........................................ 5
- ප්‍ර7- විශ්වාසය සම්බන්ධයෙන් හා ඒකදේව වාදයේ කරුණුවලදී ඇති වන කුකුස් සඳහා ප්‍රතිකාරය කුමක් ද? ............. 6